(1)

535

අභියාචනා පත්‍රය

බොළඳ අධිකරණ කලාපයේ

මහාධිකරණය

18 NOV 2010

නඩුවේ අංකය } ර්ර්ආර්/1308/92/ඉ.

මහාධිකරණයේ අපරාධ නඩු අංකය } 5377/93

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

විරුද්ධව

සමන් ප්‍රියංකර ගමගේ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිතිපති වන තිලක් ජනක පොරපන

මැතිතුමාගේ නියමය පරිදි ~~යුෂ්මතාට~~ අභියෝදනා කරන අතර එම අභියෝදනාවේ ඇතුළත් චෝදනාවල පැවරිනම්—

(2)

(339)

"

වෂී 1989 ක්වූ ජූලි මස 31 වෙනි දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණයේ බල සීමාව තුළ පිහිටි කටුවාන දී හිදී යුෂ්මහා යටි තැනැත්තන් එනම් විලින්ද, වික්‍රම, ලක්ෂ්මන් සහ පැලිතිලි පක්ෂය නොදත් වෙනත් අයවලුන් සමඟ ගිනෙන් හෝ යටි ද්‍රව්‍ය ද්‍රව්‍යයකින් හෝ යටි පුපුරන හෝ විඛාදන ද්‍රව්‍යයකින් හෝ යම් අන්දමක දමා ගසන ආයුධයකින් හෝ යටි අකාරයක උපකරණයකින් අන් කිසි තැනැත්තෙකුට මරණය හෝ තුවාල සිදු කිරීමෙන් හෝ එබන්දක් කිරීමට තැත් කිරීමෙන්, එනම් තුවක්කුවලින් වෙඩි තැබීමෙන් සමරවීර මුදලිගේ දෙනේ ප්‍රේමකීර්ති ද අල්විස් යන අයගේ මරණය සිදු කල බවත් එමගින් යුෂ්මහා දණ්ඩ නීති සංග්‍රහයේ 32 වැනි වගන්තිය හා අංක 28 දරන මහජන ආරක්ෂක (සංශෝධිත) පනත සමඟ කියවිය යුතු වෂී 1989 ක් වූ ජූනි මස 20 වන දිනැති අංක 563/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) ප්‍රකාශිත 1989 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධි විධාන හා බලතල) නියෝගයන් හී 24(1)(අ) නියෝගය ප්‍රකාර වරදක් කල බවත් එබැවින් යුෂ්මහා එකී නියෝගයන් හී 24 වන නියෝගය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය."

---

18 NOV 2010

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්.

වෂී 1992ක්වූ 12 මස 17 වෙනි දින.

කරු/-.

පැමි

1.
2.
3.
4.
5.
6.
7.
8.
9.

පැමිණිලි පක්ෂයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන දේ

1. සැකකරු විසින් සහකාර පොලිස් අධිකාරී වෙත කරන ලද පාපොච්චාරණය.

2. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව.

---

18 NOV 2010

පැමිණිලි පක්ෂයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන සාක්ෂිකරුවන්

1. ප්‍රධාන පොලිස් පරීක්ෂක – රොහාන් ප්‍රනාන්දු – පොලිස් ස්ථානය – හෝමාගම.
2. පොලිස් සැරයන් – 3632 – ආරියරත්න – පොලිස් ස්ථානය – හෝමාගම.
3. පොලිස් කොස්තාපල් – 11297 – එහින්දනාත් – පොලිස් ස්ථානය – හෝමාගම.
4. උප කාන්තා පොලිස් කොස්තාපල් – 1662 – සීතා – පොලිස් ස්ථානය – හෝමාගම.
5. සහකාර පොලිස් අධිකාරී – අනුර සේනානායක – පොලිස් කාර්යාලය – හෝමාගම.
6. පොලිස් කොස්තාපල් – 2377 – ආනර්ඩ බංඩා – පොලිස් ස්ථානය – හෝමාගම.
7. පී. රණතුංග – 21/4 – රජමහ විහාර මාවත – නාවින්න.
8. ඩී.ඩී. ධර්මසේන – 37 – දේවාල පාර – පාගොඩ – නුගේගොඩ.
9. දොස්තර ටී.එස්.පී. පන්නිල එහත්ථිය – දිසා රෝහල – හෝමාගම.

====

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්.

කැ/—13,000 (92/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

1992ක්වූ 12 මස 17 වෙනි දින.

කරු/—.

(4)

(13)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

Tr. & Audit 141 a
(E 2* c. d.) 12/46

/P.

04.04.04

18 NOV 2010

04.04.19

5

සංශෝධිත/13

මූලාරම්භක නඩුව සහ අභියාචනය ඇසීම
වර්තමාන ලැබී ඇති නඩුව ඔක්තෝබර් මාසය
දිනුව 3/7/2000 දින සවස් වේලෙහිය

18 NOV 2010

(8)

(457)

නෙළඹ මහාධිකරණ ගොලා අංක.02 හිදීය.

(නෙළඹ මහාධිකරණ විනිසුරු ඩී.ජයවික්‍රම මැතිතුමන් ඉදිරිපිටදී ය.)

නඩු අංකය:-5377/93

දිනය:-1994.03.18

- තීන්දුව -

මෙම නඩුවේ, විත්තිකරු වන, සමන් ප්‍රියංකර ගමගේ නැමැත්තාට එරෙහිව, 1989 ක්වූ ජූලි මස 31 වන දින හෝ ඊට ආසන්න දිනයකදී, මෙම අධිකරණ බල සීමාව තුල පිහිටි කටුවාන හි දී, මිලින්ද, චිත්‍රම, ලක්ෂමන් සහ පැමිණිලි පක්ෂය නොදන්නා වෙනත් අයවලුන් සමග, තුවක්කු වලින් වෙඩිතැබීමෙන් සමරවීර ලුදලිගේ දොන් ප්‍රේමතිලක ද අල්විස් නැමැත්තාගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය හා අංක.28 දරණ මහජන ආරක්ෂක (සංශෝධිත) පනත සමග නියවියයුතු, 1989 ක්වූ ජූනි මස 20 වන දිනැති අංක.563/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ ප්‍රකාශිත 1989 අංක.1 දරන හදිසි අවස්ථා (විවිධ විධි විධාන හා බලතල) නියෝගයන්හි 24(1)(අ) නියෝගය ප්‍රකාර චරදක් පල බැඳීන් එකී නියෝග යන්හි 24 වන නියෝගය යටතේ දඬුවම් ලැබියයුතු චරදක් පල බවට අධිචෝදනාවක් ඉදිරිපත් කර ඇත.

ඉහත සඳහන් 24(1)(අ) වගන්තිය මෙසේය:-

" ගිණුමෙන් හෝ යම් ද්‍රව්‍යයකින් හෝ යම් පුපුරන

හේ චිබාදන ද්‍රව්‍යයකින් හෝ යම් අන්දමන දමා

ගැන අසුඛයකින් හෝ යම් ආහා රයක උප නරණ

යකින් ; අන් කැනැත්තෙකුට මරණය සිදු තරන හේ

කුවාල සිදු තරන හෝ ආපදාවත් තිරීමට කැත් තරන

යම් කැනැත්තෙකු, වරදනට වරදනරු වියයුතු ය කවද,

දණ්ඩනීති සංග්‍රහය හේ මෙම නියෝගවල කුමන් සඳහන්

වුවන් මහාධිකරණය ඉදිරියේ වරද නරු තරනු ලැබූවිට

මරණ දඬුවමකට හෝ ජීවිතාන්තය දක්වා යන දෙයාකාරයේ

ගත

"එක් ආකාරයක බන්ධනාගාර/ තිරීමකට හෝ යටත්විය යුතුය."

මෙම නඩුවේ විත්තිකරුට එරෙහිව ඇති චෝදනාවේ භරය වන්නේ,

ලංකාවේ ප්‍රසිද්ධ නවියෙකු හා ගුවන් විදුලි නිවේදකයෙකු, තලා තරුවෙකු ලෙස

ප්‍රසිද්ධියක් උසුලන ලද ප්‍රේමතිරත්න ද අල්විස් කැමැත්තා ගේ මරණය සිදු තිරීමය.

එනම්, මෙම නඩුවේ විත්තිකරු, 'ජනතා විමුක්ති පෙරමුණ' යන දේශපාලන

පක්ෂයක නියෝජිතයෙකුව සිටියදී, පසුගිය කාලයේ එම දේශපාලන පක්ෂය විසින්

ඇති කරන ලද හිඟණ අවස්ථාවේදී, එම පක්ෂය විසින් නිකුත් තරන ලද නියෝගයක්

නඩ තරමින්, රාජකාරියේ යෙදී සිටි බවට චෝදනාවක් කර, ප්‍රේමතිරත්න ද අල්විස්

ගේ නිවසට රාත්‍රී කාලයේ ගොස් ඔහුව එළියට ගෙනවිත් මරා දැමූ බව ය.

මෙම නඩුවේ, විත්තිකරුට එරෙහිව මෙම චෝදනාව ඔප්පු තිරීමට

ඇති එකම සාක්ෂිය විත්තිකරු විසින් සහකාර පොලිස් අධිකාරී, අනුර සේනානායක

මහතාට තරන ලදැයි කියන අපරාධෝච්චාරණය පමණි.

ඒ සැර වෙම් නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි වන්නේ, විත්තිකරුව අත් අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හා විත්තිකරු පිළිබඳව ගන්නා ලද වෙනත් නොයෙකුත් පියවරවල් පිළිබඳව ඉදිරිපත් කර ඇති, පොලිස් නිලධාරීන් ගේ සාක්ෂිය පමණි. පැ.1 වශයෙන් ලකුණුකර ඉදිරිපත් කරන ලද චෝදනා පැමිණිල්ල විසින් සාක්ෂියන් ලෙස ලකුණු කිරීමට සූදානම් වූ අවස්ථාවේදී, විත්තිය, එය සාක්ෂියන් ලෙස ලකුණු කිරීමට විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී. ඒ අනුව, පැ.1 වශයෙන් පැමිණිල්ලෙන් ඉදිරිපත් කිරීමට අදහස් කරන ලද ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කරන ලද්දක්ද නැද්ද යන්න සොයා බැලීමට පරීක්ෂණයක් (වොයිර්ඩයර්- Voire Dire) පවත්වන ලදී. එම පරීක්ෂණයෙන් පසු, පැ.1 දරණ අපරාධෝද්චාරණය විත්තිකරු විසින් ස්වේච්ඡාවෙන්ම කරන ලද්දක් බවට මෙම අධිකරණය විසින් 1993.08.12 වන දින දරණ නියෝගය මගින් තීරණය කරනලදී. පිටු 44 හින් යුත් මෙ නියෝගය මෙම අපරාධෝද්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක් බවට අධිකරණය ට පිලිගැනීමට සිදුවූ හේතු විස්තරාත්මකව සඳහන් කරඇත.

මෙම නඩුවේ, ඉන්පසුව, ඉතිරි සාක්ෂි මෙහෙයවා නඩු විභාගය අවසන් කරන ලදී.

ඉන් පසුව විත්තිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා, දීර්ඝ වශයෙන් අධිකරණයට කරුණු දක්වමින් දැනට ඉදිරිපත් වී ඇති සාක්ෂි සියල්ල සැලකිල්ලට ගෙන 1993.08.12 වන දින මා විසින්, පැ.1 වශයෙන් ලකුණු කරන ලද පාපොදුචෝදනාව, ස්වේච්ඡාවෙන් කරන ලද අපරාධෝද්චාරණයක් ලෙස පිලිගැනීම නැවත සළකා බලන ලෙස ඉල්ලීමක් කර සිටියේ ය. එම ඉල්ලීම පිළිබඳව

දැනටමත් මෙම අධිකරණය යම් නිගමනයකට පැමිණ ඇති නිසා, ඒ ගැන නැවතත් සළකා බැලීමට හේතූන් දක්වා නොමැති අතර, ඒ සඳහා අධිකරණ බලයක් ද නොමැත.

චිත්තියේ නීතිඥ මහතා තරුණ දක්වමින්, චිත්තිතරු අත්අඩංගුවේ සිටි කාලය හා එසේ අත්අඩංගුවේ සිටි ආකාරය හා පොලිසිය මගින් චිත්තිතරුට ඇතිවූ නොයෙකුත් බලපෑම් ආදිය සැලකිල්ලට ගැනීමේදීත් , මෙවැනි අපරාධයක් මත චිත්තිතරුවෙකු චරදකරු කිරීම සාධාරණ නොවන බවට නොයෙකුත් නීති සිද්ධාන්ත හා නඩු තීන්දු ගුවා දක්වමින් තර්කකර සිටියේය.

මෙම චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ, හදිසි අවස්ථා රෙගුලාසි යටතේ පනවා ඇති විශේෂිත වූ නීතියක් මත ය. පසුගිය කාලයේ ලංකාවේ ඇතිවූ ඉතාමේ දරුණු අණ්ඩු විරෝධී තැරැව්ලක් හේතුවෙන් පැනවූ මෙම නීතිය යටතේ, හිතාමතාම සිදුවූ යම් යම් අපරාධ පිළිබඳව අධිකරණයේ නඩු විභාග පැවැත්වීමට අවශ්‍ය සාමාන්‍ය ආකාරයේ සාක්ෂි ලබා ගැනීමට නොහැකි හේතූන් මත , ඒ සම්බන්ධව නඩු පැවරීමේදී අනුගමනය කළයුතු විශේෂිත නීතිරීති, හදිසි නීතිය යටතේ පනවන ලදී. සාමාන්‍ය නීතිය යටතේ පිලි නොගන්නාවූ නීතිරීති, ඒ අනුව මේ සම්බන්ධව පනවන ලදී. එබැවින් අධිකරණයේ විශේෂයෙන් ම මෙවැනි විශේෂ අවස්ථාගත හේතූන් මත පනවන ලද නීතිරීති පිළිබඳවත්, එම කාලසීමාවතුල රටේ පැවති තත්ත්වයත් ,මෙවැනි නඩු විභාගයන්ද සැලකිල්ලට ගැනීමට සිදුවේ.

18 NOV 2010

(455)

(10)

මෙම නඩුවේ සාක්ෂි වලින් හෙළිදරව් වී ඇති පරිදි, මෙවැනි අපරාධයන් පිළිබඳව නඩු විභාගයක් පවත්වන අවස්ථාවකදී සාමාන්‍ය ආකාරයෙන් සාක්ෂි තෙක්සේවත් ඉදිරිපත් කිරීමට අපහසු බව පෙනීයන කාරණයකි. මෙම අධිකරණයේදී, උසාගිය අවුරුද්දකට අසන්න කාලය තුළ ක්‍රිස්තවාදය වැලැක්වීමේ පනත් හා සසඳා නීති පනත යටතේ මෙවැනි නඩු රාශියක් පිළිබඳව විභාගයට ගන්නා ලද අතර, එවැනි බොහොමයක් නඩුවලදී පොලිසිය භාරයේ සිට සටහන් කරන ලද ප්‍රකාශ ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රකාශයන් නොවන බවට තීරණය වී ඇත. මෙම අධිකරණයේදී මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලද ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රකාශයක් ලෙස මෙම අධිකරණයට පිළිගන්නා ලද එකම අවස්ථාව වේ. යම් කිසි විත්තිකරුවෙකු රක්ෂණ භාරයේ නොතබා පොලිස් ස්ථානවල සහ පොලිසිය භාරයේ තිබෙන වෙනත් ස්ථාන වල රඳවා තබාගෙන තම නෑදෑ හිතමිත්‍රාදීන්, නීතිඥ වරුන් හමුවීමට අවස්ථාවක් නොදී සටහන් කරගන්නා ප්‍රකාශ තෙක්සේවත් ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රකාශ යයි පිළිගැනීමට හෙළිකළ හැකි ය යන ප්‍රකාශය පිළිගත හැකි ප්‍රකාශයක් වේ. එම හේතූන් මත එවැනි බොහෝමයක් අපරාධෝචිත්‍යාරණයන් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට/ඉඩදීම මෙම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. මෙම නඩුවේ මෙම අපරාධෝචිත්‍යාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක් බවට තීරණය කිරීමට හේතු වූයේ, විත්තිකරු වෙනුවෙන් ම සිදු ඉදිරිපත් කරන ලද සාක්ෂි ය සහ සිදු වෙනුවෙන් කැඳවන ලද සිහුගේ මව් ඇතුළු සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලින් හෙළිදරව් වූ කරුණු හේතුවෙනි. කෙසේ වෙතත් අවස්ථා රෙගුලාසි 60(1) යටතේ යම් විත්තිකරුවෙකු විසින් කරන ලද ප්‍රකාශයක්, සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අනුචිත නොවේ නම් පමණක්, විත්තිකරුට

එවැනි

විරුද්ධව ඔප්පු කළහැකිය. එබැවින් ප්‍රත්‍යක්ෂයෙන් සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අදාල නොවන බව ඔප්පු කිරීමේ බාරය, ඒ අදාල නොවන බව තර්කයේ නියා සිටින තැනැත්තෙකු සතු වියයුතු බවට එම නියෝගය මගින් සාදනය කර ඇත. මෙම නඩුවේ පැ.1 දරණ අපරාධෝච්චාරණය පිළිබඳවද, එය සටහන් කරගත් සහකාර පොලිස් අධිකාරි වරයාගේ සාක්ෂි අවසානයේදී එම ප්‍රත්‍යක්ෂය සාක්ෂි ආඥාපනතේ, 24 වන වගන්තිය යටතේ අදාල නොවන බැව් පෙන්වීමට චිත්තිතරු විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි වලදී මෙම චිත්තිතරුට, එම පොලිස් නිලධාරීන් පසු අවස්ථා වලදී විශේෂඥයන්ගේ සැලකූ බවට තරුණු හෙළිදරව් විය.

මෙම චෝදනාවේ සඳහන් ප්‍රේමකීර්ති ද අල්විස්, ගිනිඅවියෙන් සිදුවූ තුවාල වලින් මියගිය බවට ඒ මරණය පිළිබඳ පවත්වනලද පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවෙන් සනාථවේ. වෛද්‍ය වී.එස්.පී.පන්නිල මහතාමිය විසින් එම ප.ම.පරීක්ෂණ වාර්තාවේ අතර මෙනදේෂය මරණකරුගේ බෑනා නෙනෙකු වන පුෂ්ප තරංග රණතුංග හා සාක්ෂියෙකුවන ලියනගේ දොන් ධර්මසේන විසින් සඳහන්කොට ඇත. එම ප.ම.වාර්තාවේ, වෙඩිවැදීමෙන් සිදුවූ තුවාල 3 ක් සඳහන් කර ඇති අතර, මරණයට හේතුව වශයෙන්, එම ගිනි අවියෙන් ලත් තුවාල වලින් සිදුවූ ලේ ගැනීමෙන් හා තම්පණයෙන් සිදුවූ මරණයක් බවට සඳහන් කර ඇත. එම වෛද්‍යවරිය, එම වාර්තාව ඉදිරිපත් කරමින්, පූර්වගාමී විනිසුරුතුමා ඉදිරියේ සාක්ෂි දී ඇත. එම අවස්ථාවේදී, එම පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව පැ.1 වශයෙන් ලකුණුකර ඇති අතර, පසුව අපරාධෝච්චාරණය ද පැ.1 වශයෙන් ලකුණු කර ඇත. එබැවින් එම පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව පැ.1ලී වශයෙන් ලකුණු කරවී.

මෙන දේෂය සඳහනහත්, පුෂ්ප තරංග රණතුංග ද, අධිකරණයේ සාක්ෂි දෙමින්, මෙන දේෂය සඳහන් හත් බවට සාක්ෂි දී ඇත.

මෙම සාක්ෂි සියල්ල සැළකිල්ලට ගැනීමෙදී, ප්‍රේමකීර්ති ද අල්විස්, මරණයට පත්වී ඇත්තේ, ගිනි අවියකින් කැබූ වෙඩි පහරවලින් බව පැහැදිලිවම ඔප්පු වී අත.

18 NOV 2010

(12)

(457)

වෙව නඩුවේ විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥ

මහතා රජ - එදිරිව - වෝ විසන් 1990 (2) ඒ.එල්.ආර්

293 වැනි පිටුවේ සඳහන් නඩු තීන්දුවට අවධානය යොමු කර, යම් නඩු

විභාගයකදී විත්තිකරුවෙකු විසින් කරන ලද අපරාධෝච්චාරණයක් සාක්ෂියක්

ලෙස පිළිගැනීමට තීරණය කර තිබෙන අවස්ථාවක එම නඩු විභාගයේදීට

නඩු විභාගය අවසන් වීමට පෙර යටි යටි විශේෂ හරුණු හෙළිදරව් වී

ඇත් නම් අපරාධෝච්චාරණය සාක්ෂියක් ලෙස ගැනීමේ තීරණය වෙනස්

කිරීමට අධිකරණයට බලයක් තිබෙන බවට තර්ක කර සිටියේය. එම

නඩු තීන්දුව අනුව එසේ අපරාධෝච්චාරණයක් සාක්ෂියක් ලෙස සැලකීමට

කර ඇති තීරණය වෙනස් කිරීමට නම් එම අපරාධෝච්චාරණය එලෙස

පිළිගැනීමට නොහැකි වන ආකාරයේ යම් යටි හරුණු රට පසුව

නඩුවේදීම හෙළිදරව් විය යුතුය. මෙම නඩුවේ පසුව ඉදිරිපත් වූ

සාක්ෂිවලින්ද, විත්තිකරු විත්ති කුඩුවේ නැගී සාක්ෂි දුන් අවස්ථාවේදීද

එම අපරාධෝච්චාරණය ස්වේච්චාවෙන් කරන ලද්දක් නොවන බව

පෙන්වීමට අලුතෙන් යමක් හෙළිදරව් වී නොමැත. මෙම නඩු විභාගයේදී

මුලින් මහු විසින් කරන ලද්දැයි කියන අපරාධෝච්චාරණය ස්වේච්චාවෙන්

කරන ලද්දක්ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පැවැත්වූ පරීක්ෂණයේදී

එනම් විත්තිකරුද ඉන් පසු ප්‍රධාන නඩු විභාගයේදී තවත් මහුවුන්ද විත්තිකරු

සාක්ෂි දෙමින් තමා අත් අඩංගුවට ගත් අවස්ථාවේදී පොලිසියෙන්

සිදු යම් පහර දීම් සිදු වූවත් ඉන් පසු තමාට පොලිස් නිලධාරීන්

යඹපත් ලෙස සැලකූ බව පිළිගනිමි.

මෙම නඩුවේ අපරාධෝච්චාරණය ස්වේච්ඡා වෙන්ට කරන ලද්දක්ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පැවැත් වූ පරීක්ෂණය ආරම්භ කිරීමට ප්‍රථම නඩුවේ මුල්ම සාක්ෂිකාරිය ලෙස එම අපරාධෝච්චාරණය සටහන් කර ගන්නා ලද තාන්තා පොලිස් කොස්තාපල් සීතා වනරාණි රණසිංහ සාක්ෂි දෙමින් එම අපරාධෝච්චාරණය විත්තිකරුගේ කැමැත්තෙන් කරන ලද්දක් බවට කටාවත් වැටහී ගිය බවට කරන ලද ප්‍රකාශයට විත්තියේ නිසිම අභිසෝගයක් එල්ල නොවීම පිළිබඳව විත්තියේ නීතිඥ මහතා කරුණු දක්වමින් ඇති, අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක්ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා යොදා ගැනීමට නොහැකි බවට තර්ක කර සිටියේය. අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක්ද නැද්ද යන්න සොයා බැලීම සඳහා වූ පරීක්ෂණය ආරම්භ වූයේ එය සටහන් කර ගත් පොලිස් නිලධාරියාගේ සාක්ෂියෙන් බවත්, ඊට පසු එම සාක්ෂිකාරියගේ සාක්ෂිය පැටිණිල්ලෙන් නැඳවා නැති බවටත් තර්ක කර සිටියේය. මේ පිළිබඳව මුලින්ම සඳහන් කළ යුත්තේ මෙට නඩුවේ එකට නඩු විභාගයක් පැවති අතර එම නඩු විභාගය තුළදී පැන නැගුන යටි යටි නීති ප්‍රශ්න පිළිබඳව තීරණයන් දීමට සිදු වී ඇති බවය. නඩු විභාගයක් තුල තවත් විභාගයක් පැවැත්වීම මුල් නඩු විභාගයෙන් වෙනස් වූ විභාගයක් නොවේ.

18 NOV 2010

(14)

(A57)

අපරාධ නඩුවක චෝදනාවක් ටික නඩු විභාගයක් ආරම්භ කර විභාගය අවස්ථාවෙන් යන අවස්ථාවේදී පැටිණිල්ලෙන් හා විත්තියෙන් නොයෙකුත් හිති ප්‍රශ්න ඉදිරිපත් කරමින් ඉල්ලීම් ඉදිරිපත් වූ විට ඒ පිළිබඳව අධිකරණය විසින් සලකා බලා, තීරණයක් දීම එට නඩු විභාගයේම කොටසකි. මෙම නඩුවේ අපරාධෝචිචාරණය ස්වේච්චාවෙන් කළාද නැද්ද යන්න පිළිබඳ පරීක්ෂණය මෙම ප්‍රධාන නඩුවේට කොටසකි. මෙට ප්‍රධාන නඩුවේ පැටිණිල්ලෙන් ඉදිරිපත් කිරීමට අදහස් කළ, විත්තිකරු විසින් කරන ලදැයි කියන ප්‍රකාශය සාක්ෂියක් ලෙස ඉදිරිපත් කිරීම ගැන විත්තිය විරුද්ධ විය. එම විරුද්ධ වීමට අදාලව පරීක්ෂණයක් පවත්වා අධිකරණය විසින් තීරණයක් කර ඇත. එම තීරණය දීමට පෙර සාක්ෂි වශයෙන් මෙම නඩුවේ පැටිණිල්ලේ අධිචෝදනා පත්‍රයේ සඳහන් සාක්ෂිකරුවන් සහ විත්තිය විසින් කැඳවන ලද සාක්ෂිකරුවන් සාක්ෂි දී පැටිණිල්ල ඉදිරිපත් කරන ලද එම ප්‍රකාශය නීත්‍යානුකූල සාක්ෂියක් ලෙස ඉදිරිපත් කළ හැකිද නැද්ද යන්න පිළිබඳව තරුණ සලකා බලන ලදි. මේ අනුව අපරාධෝචිචාරණය ස්වේච්චා වෙන් කළා ද නැද්ද යන්න පිළිබඳ පරීක්ෂණය මෙම ප්‍රධාන නඩුවට අදාල වූ අතුරු නියෝගයකට අදාල අරීක්ෂණයකි. එබැවින් නීත්‍යානුකූලව දිවුරුම් පිට හෝ ප්‍රතිඥා මත එම නඩු විභාගයේදී සාක්ෂි කරගෙන ඇති සාක්ෂි හා නඩු වාර්තාවේ සඳහන් කරුණු සැලකිල්ලට ගැනීම නීත්‍යානුකූල වේ.

තෙසේ වෙතත් පැටිණිල්ල විසින් ඔලින් කැඳවන ලද එම කාන්තා පොලිස් කොස්තාපල්වරියගේ සාක්ෂි යටතේ කරගෙන ඇත්තේ

මීට පෙර මෙම අධිකරණයේ සිටි පූර්වගාමී මහා ධිකරණ විනිසුරු තුමා ඉදිරිපිටදීය. පසුව මෙම නඩු විභාගය මා ඉදිරියේ අඩාලව නැවතී තැබූ ස්ථානයේ සිට පවත්වාගෙන යෑමට දෙපක්ෂයේම එකඟත්වය මත 1993. 07. 07 දින තීරණය කරන ලදී. එදිනට පෙර මෙම නඩුවේ වාර්තා සහ කර ඇති සාක්ෂි මා ඉදිරිපිටදී සටහන් කර ගන්නා ලද සාක්ෂි ලෙස සටහන් කර ගැනීමට විත්තිය එකඟ විය. ඒ අනුව නඩු විභාගය මා ඉදිරියේ පැවැත්වෙන ලදී. ඒ අවස්ථාවේදී මට පෙර මෙම අධිකරණයේ පූර්වගාමී විනිසුරු තුමා ඉදිරියේ දුසා සාක්ෂි දුන් සාක්ෂිකරුවන් නැවත කැඳවීමට හා ඔවුන්ගෙන් ගරස් ප්‍රශ්න ඇසීමට විත්තිය විසින් ඉල්ලීමක් කළා නටී එට ඉල්ලීමට අධිකරණ සංවිධාන පණතේ 48 වැනි වගන්තිය යටතේ අවසර දීමට හැකිව තිබුනි. නමුත් ටුලින් නැඳවන ලද සාක්ෂිකරුවන් නැවත කැඳවීමට හෝ ඔවුන්ගෙන් ගරස් ප්‍රශ්න ඇසීමට විත්තියෙන් කිසිම ඉල්ලීමක් ඒ අවස්ථාවේදී කර නොමැත. එබැවින් එට සාක්ෂිකරුවන් නැවත කැඳවීමේ ප්‍රශ්නයක් පැන නගින්නේ නැත. කවද, ටුලින් සැකඟන්නිමම පරිදි මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලද අපරාධෝච්චාරණය ස්වේච්ඡා වෙන් කළ බවට පැටිෂිල්ලෙන් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කළ යුතු වුවත්, එසේ ඔප්පු කළාට පසු එට අපරාධෝච්චාරණය සාක්ෂි ආඥා පණතේ 24 වැනි වගන්තිය යටතේ අදාල කරගත නොහැකි බව ඔප්පු කිරීම විත්තියට

අයත් කාර්යයනි. එම තරුණ මහප්පු නිරීම සඳහා විත්තියෙන්ම කැඳවන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුව විලිනුත් විත්තිකරු අත් අඩංගුවට ගන්නා අවස්ථාවේදී සති යටි බලපෑවි, පහර දීවී සිදු වුවත් ඉන් පසුව විත්තිකරුට හෙලිසිසෙන් සේ වෙනත් කැකැස්පෙතුගෙන් එවැනි කිසිට බලපෑමක් නොවූ බවට හෙළිදරව් වී ඇත. අත් අඩංගුවට ගෙන මාස 3 නට පමණ පසු අපරාධෝචිචාරණය සටහන් කර ගන්නා අවස්ථාව වන විට විත්තිකරුට ඉඩදීම තම ඥාතීන් හමු වීමටද පමණක් නොව වගෙස්ත්‍රාත් අධිකරණයට පවා ඉදිරිපත් කළ බව විත්තියේ සාක්ෂි වලින් හෙළිදරව් වී ඇත. එම තරුණ සැලකිල්ලට ගැනීමේදී මෙම නඩුවේ විත්තිකරු විසින් කළාය කියන අපරාධෝචිචාරණය ස්වේච්චාවෙන් කරන ලද්දක් බව, මෙම අධිකරණය තීරණය කර තිබීම වෙනස් කිරීමට තරම් ප්‍රබල විත්තියෙන් දත්වා නොමැති බවට තීරණය කරමි.

මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලදැයි කියන අපරාධෝචිචාරණය ස්වේච්චාවෙන් කරන ලද්දක් බැවින් සාක්ෂියක් ලෙස අධිකරණයට ඉදිරිපත් කිරීමට ඇති බවට තීරණය කළාට පසු පැමිණිල්ල විසින් විත්තිකරුට එරෙහිව චෝදනා ඔප්පු කිරීම සඳහා තවදුරටත් සාක්ෂි කැඳවන ලදී. අපරාධෝචිචාරණය ස්වේච්චාවෙන් කළ බවට තීරණය කළ නිසාම චෝදනාවන් ඔප්පු නොවේ. එම අපරාධෝචිචාරණයේ සඳහන් කරුණුද සාධාරණ සැකයෙන් තොරව අධිකරණය පිළිගන්නේ නම් පමණක් එවැනි සාක්ෂියක් මත විත්තිකරුවෙකු වරදකරුවෙකු කළ හැකිය. නමුත් එසේ විත්තිකරුවෙකු වරදකරුවෙකු කිරීමට ප්‍රථම එම අපරාධෝචිචාරණයේ සඳහන් කරුණු වෙනත් අපරාධ

18 NOV 2010

නඩුවක තරුණ සැලකිල්ලට ගන්න ආකාරයටත් වඩා 18 NOV 2019
ප්‍රවේශමෙන් සැලකිලිමත්ව සලකා බලා, එම අපරාධෝච්චාරණයේ
සැකයන් තරුණ සාධාරණ සැකයෙන් කොරව ඔප්පු වී තිබේද නැද්ද
යන්න තීරණය කළ යුතුය.

මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් එම අපරාධෝච්චාරණය
සටහන් කර ගන්නා ලද හා එය සාක්ෂියන් ලෙස සලකුණු කිරීමට
ඉදිරිපත් වූ සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක මහතා
සාක්ෂි දී සිටියේය. ඔහු තම සාක්ෂියේදී එම අපරාධෝච්චාරණයේ
සැකයන් මෙම අපරාධයට අදාල කොටස් පැ. 7 ඒ සිට පැ. 7 සී,
යනුවෙන් ලකුණු කර සාක්ෂි දී සිටියේය. එට පැ. 1 වශයෙන් ලකුණු
කර ඇති අපරාධෝච්චාරණයන් ඒලෙස සලකුණු කළ නොවන් අනුව
එම ප්‍රකාශ විත්තිකරු කැමැත්තෙන් කළ ප්‍රකාශයන් බව එහි සඳහන්ව
ඇත. එය ප්‍රකාශ කරන අවස්ථාවේ තමාට නිසිවෙතු විසින්
බලපෑමක් හෝ තර්ජනයක් නොකරන ලද බවත් සැකයන් කර ඇත.
තමාගේ පවුලේ සහෝදර සහෝදරියන් කවුරුත් ඇතුලුව 10
දෙනෙක්ම සිටින බවත්, එයින් 6 වැනි අයියා වන තරුණ පේස
මහතාගේ නොකොත් මහත්තයා කලින් යුද හමුදාවේ සොල්දාදුවෙක්
ලෙස සේවය කර තමා සවිග ප්‍රවන්ඩ ත්‍රියා වලට සහභාගි වී
ඔස්ස ඝෙදවුම් කදුවුරේ සිටින බවත් සැකයන් කර ඇත. 1989
ජූලි මාසයේ මාගම්මන පුරාණ විහාරයේ ලොතු හාපුදුරුවේ

18 NOV 2010

අපවත් වී එයි ආදාහනය සඳහා නෙඩී තපවින් සීට ය 10,000ව පමණ ආහාර ගැනීම සඳහා තමා සහ පත්ම සිරි නිවසට යමින් සිටියදි මුහුණ බැඳගත් තුවන්තු අතේ තියා ගත් 6 දෙනෙක් පමණ තමන් ගිය මාර්ගය අහුරා, "ඉන්දියන් හමුදාව ලංකාව නැති නරනවා, උඹලා අපේ ව්‍යාපාරයට බැඳිපල්ලා " කියා පැවසූ බවත්, එම ප්‍රකාශයේ සඳහන් වී ඇත. ඔවුන් සමඟ කථා කරමින් සිටින විට හමුදාවෙන් පැන ආ තමාගේ අයියා වන තරුණසේන ගටගේ, පියසිරි නැවැත්තා සමඟ එම ස්ථානයට පැමිණි බවත්, එම දෙදෙනාව දැනට බූස්ස ඡේදවුවේ ඡේදවුවේ සිටින බවත්, එම ප්‍රකාශයේ සඳහන් වේ.. එම අවස්ථාවේ එම තණ්ඩයියේ සිටි එන් අයෙකු තමා සහ තම අයියා පැත්තකට අඬගහගෙන ගොස් ජේ.වී.පී එකට බැඳී වැඩ කරන්න කැමැතිද කියා තමාගෙන් විමසූ බව ත්, තමා එයට කැමැත්ත ප්‍රකාශ කළ බවත් තවදුරටත් සඳහන් වේ. එම තණ්ඩයමේ සිටි නිහාන්ත නැමැත්තා බූස්ස ඡේදවුවේ දැනට සිටින බවත් එම තණ්ඩයමේ මහු නායකත්වය දෙන්නේ බව තවදුරටත් තමා දැනගත් බවත් එම ප්‍රකාශයේ සඳහන්ව ඇත. ඉන් දින කීපයකට පසුව තමා පත්මසිරිගේ නිවසට යන විට අයියා වන මහත්තයා ත්, පියසිරි යන අයත්, ප්‍රාදේශිය නායකයෙකු ලෙස හඳුන්වා දුන් මිලින්ද නැමැති පුද්ගලයාත් නිවසේ සිටි අතර, ඔහු රටේ ඇති වී තිබෙන තත්වය සහ ඉන්දියන් හමුදාව ලංකාව ආක්‍රමණය කිරීම පිළිබඳව කථා කළ බවත්, ඉන් පසු තමා පද්මසිරි, පියසිරි, සහ තමාගේ අයියා ඡායාරූප විවුක්ති පෙරවුණේ සාමාජිකයින් ලෙස

විලින්ද ඉදිරියේ බැඳුනු බවත් එම ප්‍රකාශයේ සඳහන් වේ.

2002 ජූනි 29 වැනි දින විලින්ද, විත්‍රම නැමැති පුද්ගලයෙකු සමඟ පැමිණ, විත්‍රම පේ. වී. පී. අංශයේ වැඩ කාරයෙක් බව කියාත් අයියාත් පැවසූ බව සඳහන් වේ. ජූනි 31 වැනි දින සවස් 7.00 ට පමණ විලින්ද තමාගේ නිවසට පැමිණ කටුබාන ස්කීම් එකට යන පාර පෙන්වන්න කියා ඉල්ලා සිටි විට තමා කටුබානට යෑමට කැමැත්ත පළ කර විලින්ද සමඟ යාමට එකඟ වූ බව ප්‍රකාශයේ සඳහන් වේ. විලින්ද තමාට කලින් උපදෙස් දී තිබුන පරිදි ඇස් බැඳ ගැනීමට රෙදි කැබැල්ලක් හා කොප්පියක් තමාට දුන් බවත්, ඉන් පසු තමාගේ නිවස ඉදිරිපිට පාරෙදි විත්‍රම ද එකතු වුනු බවත්, එම තුන් දෙනාම රථ උඩින් ඇති රබර් වත්තට ගිය විට එම ස්ථානයේ තවත් තුන් දෙනෙක් සිටි බවත්, එම ප්‍රකාශයේ සඳහන් වේ. එයින් එක් අයෙකු මන්වි එතේ වැඩ කරන ලක්ෂ්මන් බවට හඳුනා ගත් නමුත් ඉතිරි දෙදෙනා හඳුනා ගත්තේ නැති බව සඳහන් වේ. ඉන් පසු විලින්ද සහ තමා රබර් වත්ත අසල තිබුන පොල් ඉඩමක හෝර උරයක ළඟා තිබුන තුවක්කු දෙකක් හා පතරොම් 6 ක් එම ස්ථානයෙන් අරගෙන පැමිණි බවත්, හවුදාවේ සිටි තමාගේ අයියා මේ තුවක්කු සඟවා තිබුන ස්ථානය දන්නා නිසා විලින්ද සමඟ එම ස්ථානයට ගොස් තුවක්කුවලට පතරොම් ගෙන බවත් එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් කර ඇත. ඉන් පසු

(අ)

(අ)

ඔය දෙකම විලිනිඳගේ මහ පෙනීවීට අනුව තවම තලින් නොදැනගෙන සිටි දැන් දන්නා ප්‍රේමතිරත්නි ද අල්විස් මහතාගේ නිවසට ගිය බවට එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් කර ඇත. ඒසේ යන විට විලිනිඳ අතේ එක කුවත්කුවන්ද, විත්‍රට අතේ එන කුවත්කුවප්ද තිබුන අතර, සියළු දෙනාට වුණු රෙදි කඩතිනි වසාගෙන හොල්පි දාගෙන සිටි බවත්, විලිනිඳ හොඳට නිදේ නැප් එකනි දාගෙන සිටි බවත් , නාදුනන දෙදෙනාගෙන් එක් අයෙකු මෝපින් බැගයකින් හිස ආවරණය කරගෙන සිටි බවත්, එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් වෙයි. ප්‍රේමතිරත්නි ද අල්විස් මහතාගේ නිවස ඉදිරිපිට පාරේ අනික් පැත්තේ වෙල අද්දර නිවාස තීපයන ලයිට් දමා තිබුන නිසා එම නිවාස වල ලයිට් නිවීමට මම සහ ලක්ෂ්මන් , විත්‍රටගේ නියෝගයට අනුව ගොස් එම නිවාස වල ලයිට් නිවා දැමීමට නිවැසියන්ට දැන් වූ බවත් ඒ අනුව ඔවුන් ලයිට් නිවූ බවත් ප්‍රකාශයෙන් සඳහන් වෙයි. එම ලයිට් නිවා දමා තමා සහ ලක්ෂ්මන් ප්‍රේමතිරත්නි ද අල්විස් මහතාගේ නිවස ළඟට පැමිණ නිවස ඉදිරියේ සිටි නඟින්ට නිවස ඇතුලත සිටි තවිටියගෙන් නෙනෙක් ජනෙල් රෙදිද මෑත් කර පාර දෙස බැලීවේදී ගෙය තුල කොණ්ඩය කැපූ අවුරුදු 18 ක් පමණ ගැහැණු ළමයෙකු සිටිනවා දුටු බව එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් වෙයි. එවිට ගෙයි පිටි පස්සෙන් ඇතුල් වීමට ගිය තුන් දෙනාගෙන් එක් නාදුනන අයෙකු "උඹට අපි ලියුම් දෙනවා එව්වා. උඹ ඒවා ගෙනත් ගත්තේ නැත්ද ?' කියා ප්‍රශ්න කරනවා කනට ඇසුන බවද එම ප්‍රකාශයේ සඳහන් වෙයි. ඒ අවස්ථාවේදී

18 NOV 2011

ගෙයි සිටි අය එම ලියුම ආ වට පස්සේ තවා වැඩට නොගොස් ගිවාඩු පිට සිටිනවා නියා පිළිතුරු දෙනවා කණට ඇහුන බව ද එහි සඳහන් වෙයි. කුඩා ළමයෙන් හා ගැහැණු නෙනෙක් සිටිනවා තවා දුටු බවත්, ඉන් පසු මිලින්ද හා කණ්ඩායමේ නාදුනන අයත් ගෙයි සිටි ප්‍රේමතිරිහි ද අල්විස් මහතා සමඟ කථා කරමින් සිටිනවා දුටු බවත්, එම ප්‍රකාශයේ සඳහන් වෙයි. ඉන් පසුව ප්‍රේමතිරිහි ද අල්විස් මහතාද නැටුව පිරිස නටුවාන, තා ගම්මන හන්දිය අසලට පැමිණි බවත් ඒ අතරතුරදී මිලින්ද හා ප්‍රේමතිරිහි ද අල්විස් මහතා කථා කරමින් පැමිණි බවත් ප්‍රකාශයේ සඳහන් වෙයි. නටුවාන හන්දියේ මිලින්ද ප්‍රේමතිරිහි ද අල්විස් මහතා සමඟ කථා කරමින් සිටින විට එක වරට අතේ තිබුන තුවක්කුවකින් බිමට වෙඩිල්ලක් තැබූ බවත්, ප්‍රේමතිරිහි ද අල්විස් මහතා ඒ වෙලා වේ බිම ඇද වැටුන බවත් එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් වී ඇත. එවිට මිලින්ද බලවට තියපන් නියා කිව්ව බවත්, එවිට විත්‍රම නැමැත්තා වෙඩිල්ලක් තැබූ බවත් ඒ සමඟ ම තවත් තුවක්කුවක් ඇතිව තවා සමඟ පැමිණි තවා නාදුනන පුද්ගලයින්ගෙන් එක් අයෙකු වැටී සිටි ප්‍රේමතිරිහි අල්විස් මහතාට තවත් වෙඩිල්ලක් තැබූ බවත් එම ප්‍රකාශයේ සඳහන් වෙයි. ඉන් පසු සියළු දෙනාට තර්ජන කිරීමින් නාගම්මන දෙසට පැමිණි බවත්, මිලින්ද තවාට තුවක්කු දෙක සහ පතරොම් ආපසු අරන් යන්න නියා තිබූ බවත්, ඒ අනුව තුවක්කු දෙක හා පතරොම් තුන පොලිස් වත්තේ තිබූ ස්ථානයේම ගෙනත් තිබූ බවත් සඳහන් වෙයි.

(467)

(ඇ)

18 NOV 2010

ඉහතින් සඳහන් කරේ මෙම නඩුවේ විත්තිකරු විසින් පහතර පොලිස් අධිකාරී ඇතුර සේනානායකට කරන ලදැයි කියන පිටු 14කින් යුත් සාරාංශ ලේඛනය කරන ලද ප්‍රකාශයෙන් මෙම නඩුවට සම්බන්ධ වූ පැ.7 ඒ සිට පැ. 7 ඉ දක්වා වූ කොටස් බවයි. ඉහත සඳහන් කොටස් වලට අමතරව වෙනත් කරුණු පිළිබඳව දීර්ඝ විස්තර වසි සඳහන් වේ. එහෙත් සඳහන් කොටස් ඉදිරිපත් කළාට පසුව පහතර පොලිස් අධිකාරී වරයා ඉහත් එම ප්‍රකාශයේ අඩංගු එම කරුණු සම්බන්ධයෙන් දීර්ඝ විශයෙන් මරස් ප්‍රශ්න අසා සිටියේය. ප්‍රේම කීර්තිද අල්විස් ජන මාධ්‍යයේ ප්‍රවුඩ් ස්ථානාධිපති සිටි හෙතෙකු වන්, නියර ගුවන් විදුලියෙන් අසන්නට හා රූපවාහිනියෙන් අසන්නට හා දකින්නට ලැබුන කැනැත්තෙකු වන් ශිෂ්ඨ ආගන්තුක කැනැත්තෙකු බවත්, මරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් පහතර පොලිස් අධිකාරීවරයා පිළිගත්තේය. එමෙන්ම සහතර පොලිස් අධිකාරීවරයාද රූපවාහිනියෙන් හෙවත් නිතර ගීත ගායනා කරන බවත්, පිළිගත්තේය. මෙම සහතර පොලිස් අධිකාරී වරයා ගීත ගායකයෙකු වන බව විත්තිකරුද පිළිගෙන ඇති කරුණකි. තවදුරටත් මරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තමා හෝමාගම ප්‍රදේශයේ පැමිණියේ 1990 ජූනි මාසයේ බවත්, රට ප්‍රථම අවස්ථාවකදීත් මෙම වූදිත අත් අඩංගුවට නෙත මුදා හැර සිටි කැනැත්තෙකු බවත්, පිළිගත්තේය. එම අවස්ථාවේදී මෙම විත්තිකරු හෝමාගම උසාවියට ඉදිරිපත් කර ඇප පිට නිදහස් කළ බවට දැනීමක් ඇතත්, විස්තර කිමට නොහැකි බව සහතර පොලිස් අධිකාරී වරයා කියා සිටියේය. මෙම විත්තිකරුගේ අපරාධෝච්චාරණය සම්බන්ධ කර ගන්නා

පාරවිදි සකුරු ලියනය තල කන්තෝරු පොලිස් කොස්තාපල් චරිය සහ [illegible]
බඩා නැමති රාළහාමි එම ස්ථානයේ සිටි බවත්, විත්තිකරු ඉදිරිපත්
කරන සාක්ෂිවේදී රොහාන් ප්‍රනාන්දු පැමිණ ආපසු ගිය බවත්, සහකාර පොලිස්
අධිකාරිවරයා පිළිගත්තේය. අපරාධෝච්චාරණය පටහන් කර අවසන් වන
තුරුම ආතර් බංඩා මෙම ස්ථානයේ රැඳී සිටි අතර, ඒ සඳහා විශේෂ
හේතුවක් නොතිබූ බවත්, හෝමාගම ප්‍රදේශය ඒ කාලයේ ත්‍රස්තවාදී තවපුතු
වලදී ගොඩ දරුණු පීඩනයකට ලක්වූ ප්‍රදේශයක් බවත්, කවදුරටත් බහු තියා
සිටියේය. ආතර් බංඩා එම ස්ථානයේ සිටීමෙන් බලපෑමක් සිදුවේ යැයි
නොමා නොයිතු බවත්, මහු හරය ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තියා සිටියේය.
එම ආතර් බංඩාට විරුද්ධව දත් ගැලවීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ
නඩුවක් තිබුන බව්ද සාක්ෂිකරු පිළිගත්තේය. එම නඩුවේ පළවෙනි විත්තිකරු
රොහාන් ප්‍රනාන්දු බවත්, දෙවෙනි විත්තිකරු ආතර් බංඩා බවත්, සාක්ෂිකරු
පිළිගත්තේය. එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ ජායාරූපික පිටපතක් විත්තිය විසින්
වී.1 ලෙස ලකුණු කර ඉදිරිපත් කලාය. එම නඩුවේ දෙවෙනි විත්තිකරු වන
ආතර් බංඩාත්, තුන, හතර, විත්තිකාර පොලිස් නිලධාරීනුත් එම වී.1 පෙත්සමේ
සඳහන් විපේසිරි නැවැත්වාත් නීති විරෝධීව අත් අඩංගුවට ගෙන ඇති බවට
ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර වන්දි ගෙවීමට නියම කර ඇත. එම වී.1
සඳහන් දෙවෙනි වගඋත්තරකරු, මෙම නඩුවේ විත්තිකරු, තමා වෙත අපරාධෝච්චාරණය
කරන අවස්ථාවේ සිටි නිලධාරියා බවද, සහකාර පොලිස් අධිකාරිවරයා පිළිගත්තේය.
එවැනි නඩුවක් ආතර් බංඩාට එරෙහිව තිබුන බව දැනගෙන සිටියත් තමා
ඉදිරිපිට මේ විත්තිකරු අපරාධෝච්චාරණයක් නිරීක්ෂිදී බහුගෙන් බලපෑමක් සිදුවේ

18 NOV 2010

ඒ නිසා නොසිතූ බවත්, සහකාර පොලිස් අධිකාරි වරයා නවදුරටත් කියා සිටියේය. අපරාධෝච්චාරණය සටහන් නිරීක්ෂක ප්‍රථම පොදියිය විසින්ද මේ විත්තිකරුගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බවත්, එම ප්‍රකාශය අඩංගු ලිපි පොදුව ඒ අවස්ථාවේ මගහරින් කියවා බව සත්‍ය බවත්, එම ලිපිගොනුව පරීක්ෂා කිරීමෙන් පසුව මෙම අපරාධෝච්චාරණය කළා සටහන් කර ගත් බවත්, සාක්ෂිකරු පිළිගත්තේය. ඉදිරි අවස්ථා රෙගුලාසි 60 (1) වගන්තියේ විධිවිධාන විත්තිකරුට පැහැදිලි කර දුන් බවත්, මෙම සාක්ෂිකරු කියා සිටියේය. විත්තිකරුගේ ප්‍රකාශයේ සඳහන් පිළින්ද, විප්‍රම වැනි නැනැත්තන් පිළිබඳව පරීක්ෂණ පවත්වා නිමෙන බවත්, එම පරීක්ෂණ කර ඇත්තේ මෙහත් නිලධාරීන් තිදෙනෙක් බවත්, මිනු තවදුරටත් කියා සිටියේය. මෙම විත්තිකරු අත් අඩංගුවට ගත් අවස්ථාවේ තමා එම ප්‍රදේශය වන හෝමාගම සහකාර පොලිස් අධිකාරී නොවූ බෙයින් තමා ඒ පිළිබඳව ප්‍රවෘත්ති නොකළ බවද මිනු කියා සිටියේය. නමුත් අපරාධෝච්චාරණයේ සඳහන් පුද්ගලයින් පිළිබඳව පරීක්ෂණ පැවැත්වූ බවට සටහන් වී තිබුණ බව මිනු කියා සිටියේය. මෙම නඩුවේ විත්තිකරු අත් අඩංගුවට ගැනීමට තමා සම්බන්ධ නොවූ බවත්, එසේ තමා මෙම ප්‍රදේශයේ සහකාර පොලිස් අධිකාරී වරයා නොවූන බවත්, තමා තලේ අපරාධෝච්චාරණය සටහන් නිරීම පමණක් බවත්, මෙම සාක්ෂිකරු නවදුරටත් කියා සිටියේය. ඉහත සඳහන් අපරාධෝච්චාරණය සටහන් කර ගත් සහකාර පොලිස් අධිකාරී සුනුර සේනානායක දැන් පොලිස් නිලධාරියෙක් බවත්, විත්තියේ නීතිඥ මහතාද ඔරස් ප්‍රශ්න වලදී කියා සිටියේය. මිනු ඒ පිළිබඳව මෙම සාක්ෂිකරුට

මෙසේ යෝජනා කර සිටියේය.

" ප්‍ර: මම තොමෝට කියන්නේ කවා දැක්ක පොලිස් නිලධාරියෙක් කිව්ව මේ සිද්ධිය සම්බන්ධයෙන් තමාගෙන් ඉටුවිය යුතු සේවය ඉටුවුනේ නැහැ කියලා?

උ: මා පිළිගන්නේ නැහැ. "

විත්තියෙන් මෙම සහකාර පොලිස් අධිකාරී වරයාගෙන් දිර්ඝ ලෙස හරස් ප්‍රශ්න අසා ඇත්තේ මෙම අපරාධෝච්චාරණය නිසි අයුරු සටහන් කර ගෙන නොමැති බව පෙන්වීමටය. එමෙන්ම මෙම ප්‍රකාශයේ අවංකූ කරුණු ගැනද ඩහූ පරීක්ෂා නොකළ බව මෙම හරස් ප්‍රශ්න වලදී යෝජනා කර ඇත. එමෙන්ම ප්‍රේම තීරකි ද අල්විස් ගේ මරණය සම්බන්ධයෙන් ලිපි නොතුබ වැසීමට අවශ්‍ය නිසා වෙවැනි ප්‍රකාශ ලබා ගත් බවත් , එම මරණය සම්බන්ධයෙන් රජය දැඩි උනන්දුවක් දැක්වූ නිසා ඒ පිළිබඳව වෙලෙස කටයුතු කර ඇති බවත්, යෝජනා කර සිටියේය. ඒ හැර වෙම සහකාර පොලිස් අධිකාරී වරයා අපරාධෝච්චාරණය සටහන් කර ගන්නා අවස්ථාවේ විත්තිකරුට බලපෑමක් කල බවට හෝ කරදරයක් කල බවට යෝජනාවක් කර නොමැත. විත්තියෙන් කියන පරිදි විත්තිකරුට මෙම අපරාධෝච්චාරණය සිදුවීම සඳහා බලපෑමක් කරදරයක් එය සටහන් කර ගත් සහකාර පොලිස් අධිකාරී වරයා , කලා නම් ඒ පිළිබඳව දිර්ඝ වශයෙන් සහකාර පොලිස් අධිකාරී වරයාගෙන් ප්‍රශ්න කල හැකිව තිබුණි. එසේ වුවත් මෙම සහකාර පොලිස් අධිකාරී වරයාගෙන් එවැනි තරුණ පිළිබඳව ප්‍රශ්න කර නැති අතර, එවැනි

18 NOV 2010

යෝජනාවක්ද කර නොමැත. මේ අනුව වෙලි සහකාර පොලිස් අධිකාරී වරයාගේ වචන ඇතිමය අභියෝගයට ලක්කර නොමැත. ඉහතින් සඳහන් කල පරිදි මෙම අපරාධෝවිචාරණය සටහන් කර ගැනීමේදී වෙනත් නිලධාරියෙකුගෙන් බලපෑමක් සිදු වීමට ඉඩ ඇති බවට සඳහන් කර ඇතත් සහකාර පොලිස් අධිකාරී වරයා විත්තිකරුට බලපෑමක්, තර්ජනයක් වූ බවට යෝජනාවක් කර නොමැත. මෙම නඩුවේ ඉහතින් සඳහන් සහකාර පොලිස් අධිකාරී වරයා සාක්ෂියෙහි බවත්, ඔහු විසින් සාක්ෂිය කරන ලද කීක වලට තමා ඇහුම්කන් දෙන බවත්, විත්තිකරු පිළිගෙන ඇත. මේ අනුව වෙලි සාක්ෂිකරු අපරාධෝවිචාරණය සටහන් කර ගැනීමේදී විත්තිකරුට යම් බලපෑමක් හෝ තර්ජනයක් කල බවට කරුණු හෙළිදරව් වී නැතිවා පමණක් නොව, ඒ පිළිබඳව ඔහුට අභියෝගයක්ද මේල්ල කර නොමැත. ඔහු සහකාර පොලිස් අධිකාරීවරයෙකු බැවින් පහලින් සිටින පොලිස් කොස්තාපල් වරයා ඒ අසල සිටීමෙන් බලපෑමක් වූයේ යැයි විශ්වාස කල නොහැකිය.

පැහැදිලිලෙන් ඉහ් අනුව සහකාර පොලිස් අධිකාරී රෝහන් ප්‍රනාන්දු සාක්ෂි දී සිටියේය. එම සාක්ෂිකරු වී.1 දරණ නඩුවේ පළවෙනි චිහදක්කරුවරුවේ. එම නඩුවේදී පළවෙනි වගඋත්තර කරු විසින් පෙත්සම්කරුට චෝදිත අවියයුතු බවට නියම කර ඇති නිලධාරියෙකි. එම වී. 1 දරණ නඩුව අදාළ වන්නේ වෙනත් පෙත්සම් කරුවෙකුට අදාළ සිද්ධියකටය. තමා 1990.04.01 දින හෝමාගම

පොලිස් මූලස්ථානයේ පොලිස් පරීක්ෂක වරයා වශයෙන් සේවය කල ඔවුන්, ඒ කාලයේ ජේ. වී. පී සම්බන්ධව චූදිතයින් ගැන පරීක්ෂණ කටයුතු වලට යෙදී සිටිය බවත් පිළිගත්තේය. එම කාලයේ හෝමාගම සහකාර පොලිස් අධිකාරී වරයා වශයෙන් සේවය කලේ ජේ.කේ.ඩී.ගුණසිලක මහතා බවත්, තමා ත්‍රස්තවාදී මර්ධන ඒකකයේ භාරව කටයුතු කල බවත් කියා සිටියේය. තමාට පුද්ගලික මිත්‍රකරුගෙන් ලැබුන තොරතුරු අනුව මෙම නඩුවේ විත්තිකරුවන් අත් අඩංගුවට ගත් බවද, ඔහු කියා සිටියේය. ඒ අනුව 1990.05.06 වෙනි දින මෙම විත්තිකරුන් අත් අඩංගුවට ගත් බවත්, එදින ඔහු අත් අඩංගුවට ගත් ආකාරය සහ එයට සහභාගී වූ නිලධාරීන් හා යොදා ගත් වාහන පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු දක්වා සිටියේය. සැකකරු අත් අඩංගුවට ගැනීමට උත්සාහ ගත් අවස්ථාවේදී ඔහුගේ නිවස පරීක්ෂා කිරීමට කිය බවත්, එවැනි අවස්ථාවක විත්තිකරු නිවසේ නොසිටි අතර, ඔහු පිටරට ගිය බව නිවසේ සිටි අය ප්‍රකාශ කල බව මෙම සාක්ෂිකරු කියා සිටියේය. ඒසේ වුවත් ඒ පිළිබඳව තවා වැඩිදුරටත් පරීක්ෂාවෙන් පසු මෙම විත්තිකරු තමාගේ කණ්ඩායම විසින් දැන අත් අඩංගුවට ගත් බවත්, එලෙස විත්තිකරු අත් අඩංගුවට ගත්තේ ඔහුගේ නිවසේ සිට සැකපුම් තහරක් පමණ දුර ස්ථානයකදී බව තවදුරටත් කියා සිටියේය. ඒ අවස්ථාවේ විත්තිකරු හඳුනාගත්තේ තම කණ්ඩායමේ සිටි මෙන්ඩිස් රාළහාමි බවත්, ඔහු අත් අඩංගුවට ගැනීමේදී පැන යන්න උත්සාහ කල නමුත් , අවහිරයක් නොතිබුන බවත්, පිළිගත්තේය. විත්තිකරු අත් අඩංගුවට ගෙන එදින

18 NOV 2010

(473)

රාත්‍රී 9.30 ට පොලිස් ස්ථානයට පැමිණ සැකකරු සමඟ වැඩිදුර පරීක්ෂණ පැවැත්වූවාට පසු වෙනත් ප්‍රදේශවලට යෑමට සිදුවූ බවත්, එහු පිළිගත්තේය. එම පසුව ව්‍යක්තිය 1 යන සේවයට බාර දී එහු රඳවා තැබීමේ නියෝගයක් සහකාර පොලිස් අධිකාරී තුමන්ලකගෙන් ලබාගත් බවද කියා සිටියේය. එවැනි නියෝගයක් ලබා ගැනීමේ පොලිස් පිළිවෙතේ අවශ්‍යතය පිළිබඳ එහු රඳවා තැබීමට පෙර නොදැනි බව දන්නා බවත් එහු පිළිගත්තේය. එම රඳවා තැබීමේ නියෝගය 90.05.07 වෙනි දින සිට දින 90 වනට වලංගු වන අන්දමට ලබා ගත් බවත්, සැ. 3 වශයෙන් ඉදිරිපත් කර ඇත්තේ එම රැඳවුම් නියෝගයේ පිටපත බවත්, එහු කියා සිටියේය. පසුව මෙම විත්තිකරුගේ අපරාධෝච්චාරණය පවත්වා ගැනීම සඳහා සහකාර පොලිස් අධිකාරී වරයා වෙත ඉදිරිපත් කළ බවද, එහු පිළිගත්තේය. ඒ අනුව 1990.08.30 වෙනි දින සහකාර පොලිස් අධිකාරී අනුරී සේනානායකට ඒ බව දැනුම් දී විත්තිකරුගේ අපරාධෝච්චාරණය පවත්වා ගැනීම සඳහා උද්දිරිපත් කළ බවද එහු කියා සිටියේය. මේ අනුව අපරාධෝච්චාරණයේ විත්තිකරුගෙන් සටහන් කරගෙන ඇත්තේ විත්තිකරු අත් අඩංගුවට ගෙන මාස 3 1/2 කටයි පසුවය. අපරාධෝච්චාරණය පවත්වා ගත්තට පසුව සහකාර පොලිස් අධිකාරී වෙත විත්තිකරු උද්දිරිපත් කළ අන්දම බංඩා රාළහාමි විසින් නැවත විත්තිකරු උපපේවයට බාර දුන් බවත්, එහු පිළිගත්තේය. ඊට අමතරව මේ විත්තිකරු 1990.05.06 වෙනි දින අත් අඩංගුවට ගත් පදුව මී චාර්තා අංක 3157 යටතේ හෝමාගම මහේස්ත්‍රාත් වරයා වෙත 1990.06.06

දින ඉදිරිපත් කල බවද කියා සිටියේය. මේ අතුව මෙම චිත්තිකරු
වෙන් අපරාධෝච්චාරණයන් පටහන් කර ගැනීමට මාස 2 1/2 කඩදු
කලින් මහේස්ත්‍රාත් වරයා වෙත ඉදිරිපත් කර ඇත. එලෙස මහේස්ත්‍රාත්
වරයා වෙත ඉදිරිපත් කර නමා විසින්ම ඇසතින් කරන ලද එම වී චාර්තුව
මත මවත්, එස පැ. 4 වශයෙන් ඉදිරිපත් කරමින් මෙම සාක්ෂිකරු
කියා සිටියේය. ඉන් පසුව නැවතත් පැ. 5 දරණ රැඳවුම් නියෝගයක්
විත්තිකරු වෙනුවෙන් දින 30 කට ලබා ගත් බවත්, ඔහු කියා සිටියේය.
එයට අදාළ වෙනත් ලේඛණ පැ. 6 වශයෙන්ද ඔහු ඉදිරිපත් කලේය.
අත් අඩංගුවට ගෙන මාසයක් පැනුලන මහේස්ත්‍රාත් වරයෙකු වෙත ඉදිරිපත්
කල ගෙයින් නීතිඥට එහෙට නමා විත්තිකරුව එලෙස ඉදිරිපත් කල බවත්,
විත්තිකරු අදිසි නීතිඥ යටතේ දීර්ඝ කාලයක් රඳවා ගනු ලබන්නේ පැය
24 ක් ඇතුලත රැඳවීම් ප්‍රමාණවත් නොවන නිසා බවද ඔහු කියා සිටියේය.
ඉරුස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තවා ගෝමාගම පොලිසියට පැමිණ සියලුදු
දවස් 6 ක් ගතවූ විට මේ විත්තිකරු අත් අඩංගුවට ගත් බවත්, එලෙස
අත් අඩංගුවට ගත්තේ පිටිපන ප්‍රදේශයේ සිටි නමාගේ මිත්‍රයෙකු
මගින් බවත්, කියා සිටියේය. නමා ඉදිරිපත් කල රැඳවුම් නියෝගය අනුව
මෙම විත්තිකරු 07 වන මාසයේ 28 වෙනිදා සිට පැලවත්ත රැඳවුම්
බන්ධනාගාරයේ තබා ගත්තා ලෙස නියෝගයක් ලබාගත් බවත්, ඒ අනුව සකස්
කරා කල බවත්, කියා සිටියේය. නවුත් පැලවත්ත බන්ධනාගාරයේ මේ විත්තිකරු

18 NOV 2019

කාර යැවීමට නොපැහැනි බවත්, ඔවුන් පැමිණ යාර යන්න කුරු පොලිසියේ රඳවා යන් බවත්, කියා සිටියේය. විත්තිකරු ලෙස වෙත් සඳුවුරකට කාරදීමේ කටයුතු වෙනත් අංශයකින් කරන බවයි, එය කියාවට සිටින්නේ, ජනතන්ද [illegible] නැමැත්තා බවත් කියා සිටියේය. වෙඩිනි සැකකරුවන් සිටුඹට විශේෂ ආරක්ෂක විධිවිධාන යැකි බැවින් පලවන්ය සඳවුරට ගෙන යන සැකකරුවන් යවනු ලබන්නේ එම කඳවුරෙන්නැවුත් දන් පසුව බවද, ඔහු කියා සිටියේය. එලෙස මෙම රැඳවුම් සඳවුරේ නැවැත්වීමා නියම කර ඇති මේ පුද්ගලයාගෙන් ජූලි 24 වෙනිදා, නියෝගයෙන් මාසයකුත් දවස් හතකට පසුව සහකාර පොලිස් අධිකාරී වරයා වෙත අපරාධෝවිචාරණයක් සඳහා ඉදිරිපත් කල බව ඔහු පිළිගත්තේය.

මෙම නඩුවේ මෙම සැකකරු 1990 මැයි 06 වෙනි දින අත් අඩංගුවට ගැනීමට ප්‍රථම වහාවතුන් ඔහු අත් අඩංගුවට ගෙන විදාහැර ඇති බව කමාට ආරංචි වුන බව මෙම සාක්ෂිකරු පිළිගත්තේය. මුල් අවස්ථාවේ ඔහුදීක් අධිකරණයට යුද්ධ හමුදාවෙන් පරීක්ෂණ පවත්වා අධිකරණයට ඉදිරිපත් කර විදාහැර ඇති බව මේ සහකාර පොලිස් අධිකාරී වරයා පිළිගත්තේය. එවකට එම ප්‍රදේශයේ සහකාර පොලිස් අධිකාරීව සිටි ගුණතිලක මහතා විසින් මෙම විත්තිකරු මුල් අවස්ථාවේ විදාහැර ඇති බව, එනම් අමා එම ප්‍රදේශයේ සේවය කර නොසල බවද මෙම සාක්ෂිකරු පිළිගත්තේය. ලෙස්ලි සිද්ධියෙන් මියගිය ප්‍රේම කීර්තිද අල්විස් මහතා ප්‍රසිද්ධ කැනැත්තෙකු බැවින් ඒ පිළිබඳව විශේෂත්වයන් නොදැන්වූ බවත්

වෙනත් අපරාධයක් හා සම්බන්ධ පරීක්ෂණ පැවැත්වූ බවත්, මෙම සාක්ෂිකරු කියා සිටියේය. අපරාධෝච්චාරණය සටහන් කර ගැනීමට පැවි අවස්ථාවේ මේ විත්තිකරු පොලිසියට නල ප්‍රකාශයේ පිටපතක් හා පරීක්ෂණ වල උපෙක්ෂ සැවි බව ඔහු පිළිගත්තේය. මෙම අපරාධෝච්චාරණය කිරීමට පසියකට පෙර විත්තිකරු එවැනි ප්‍රකාශයක් කිරීමට අවශ්‍ය යැයි තමාට දැන්වූ බවත්, ඉන් දින කිපයකට පසුව තමා සහකාර පොලිස් අධිකාරියා වෙත ගොස් දැනුම් දුන් බව කියා සිටියේය. විත්තිකරු එවැනි ප්‍රකාශයක් කිරීමට කැමැත්ත ප්‍රකාශ කල නමුත්, විත්තිකරුට තවදුරටත් ඒ පිළිබඳව කිසා බැලීමට අවස්ථාව දී දින කිපයකට පසුව එලෙස සහකාර පොලිස් අධිකාරී වරයාට දැනුම් දුන් බවද මෙම සාක්ෂිකරු කියා සිටියේය. විත්තිකරු ඒ සඳහා ඉගෙන ගිය ආකාර බංඩා සම්බන්ධයෙන් සම්පූර්ණයක් පැවැත්වූ බවත්, ඒ පරීක්ෂණ පැවැත්වුයේ දක්ෂ ගැලවීමත් සම්බන්ධව නොව සැකකරුවන් අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් බවත් කියා සිටියේය. එම ආකාර බංඩා නැමති පොලිස් කොස්තාපල් වරයා මෙනවුන් අයිතිවාසිකම් නඩුවේ වරදකරුවෙක් වූ බවද, මෙම සාක්ෂිකරු පිළිගත්තේය. මීට පූර්වෙක් මේ විත්තිකරුට එරෙහිව හිඹි කැමීමත් සම්බන්ධයෙන් චෝදනාවක් එල්ල කර හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කල බවත් පසුව දැන ගත් බව සරස් ප්‍රශ්න වලදී පිළිතුරු දෙමින් මෙම සාක්ෂිකරු පිළිගත්තේය. සඳුදාවේ වැඩ කරන උසස් නිලධාරියෙකු වන මහීපාල නැවැත්තාගේ ගෙට හිඹි කැමීම සම්බන්ධව

18 NOV 2010

වූ සිද්ධියයි වටේ , ඒ පදිංචිඳව විත්තරයෝ කවා නොදන්න බවත්, කියා සිටියේය. මේ විත්තිකරු පිළිබඳව දඳුන ගැනීමේ පොරවිවුවත් නොලැබුණු බවත්, පොලිසියේ දීර්ඝ කාලයක් විත්තිකරු සිටි නිසා දැනා ගැනීමේ පොරෝවුවක් වෙනත් පොලිසියේ කවරාට හෝ තිබී බවත්, ඔහු කියා සිටියේය. විත්තිකරු රඳවා සිටියේ නීතර පත එන අයට පෙනෙන ස්ථානයක බවත්, ඔහු කියා සිටියේය.

විත්තිකරුගෙන් විරෝධී වර ප්‍රශ්න කල බවත්, ඒ අපරාධ පරීක්ෂණ කටයුතු වලට අදාළව සහ විත්තිකරුගේ දිවා සාධනය සඳහා, හා ආරක්ෂාව සම්බන්ධයෙන්ද ; ප්‍රශ්න කල බවත්, ඔහු තවදුරටත් කියා සිටියේය. මේ විත්තිකරු අත් අඩංගුවේ සිටින කාලයේ කිසිම අවස්ථාවක කිසිම නෙනෙතුට විරුද්ධව පැමිණිල්ලක් කර නොමැති බව ඔහු තවදුරටත් කියා සිටියේය. මෙතට සම්බන්ධ කැනැක්කන් අත් අඩංගුවට ගැනීම සඳහා පරීක්ෂණ පැවැත්වූ බවත්, සමහර අය පණවී සිටි බවද, සමහර අය සීමණ සමයේ අතුරුදහන් වී ඇති බවට නොරතුරු ලැබී ඇති බව කියා සිටියේය. මෙම නඩුවේ ඉහත සඳහන් පොලිස් නිලධාරියාගේ සාක්ෂි වලින් හරය ප්‍රශ්න වලදී හෙළිදරව් වූ කරුණු සැළකිල්ලට ගැනීමේදීත් මේ විත්තිකරු අත් අඩංගුවට ගත් එම පොලිස් නිලධාරියා විත්තිකරු අත් අඩංගුවට ගෙන ආකාරයක් ඇතුලත මියේග්‍රාෆ් වරයා වෙත ඉදිරිපත් කර ඇත.

තවද ඔහු පොලිසියට යන එන යෙට ඒනෑ ස්ථානයක රැඳවා

සිටි බවද ප්‍රකාශ කර ඇත. මෙම පොලිස් නිලධාරියා

ඔහු සටකේ සේවය කල බව පාර්ථ බංඩා රාළහාමි

මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් නඩුවේ වරදකරු

වී ඇති බවට කරුණු හෙළි දරවු විය. මෙම

නඩුවේ විත්තිකරුට එහර දුනු බවක් හෝ වෙනත්

බලපෑමක් නල බවට ඔහුගේ සාක්ෂියෙන් කරුණු

හෙළිදරව් වී නොමැත. නීයමිත ආකාරයෙන්

රැඳවීම් නියෝගයක් ලබාගෙන ඔහුගෙන් ප්‍රකාශයක්

සටහන් කර ගන්න ඇති අතර, නීතියට එකඟව මහේස්ත්‍රාත්-

වරයා වෙත ඉදිරිපත් කර ඇත. විත්තිකරුට

යම් බලපෑමක් කරුණක් වූයේ නම් විත්තිකරුට ඒ

පිළිබඳව මහේස්ත්‍රාත් අධිකරණයේ කරුණු දැක්වීමටත්

මේ අනුව අවස්ථාවක් ලැබී ඇත. මෙම සාක්ෂිකරු

හා පාර්ථ බංඩා හැමුත්තන් වෙනත් සැකකරුවන් පිළිබඳව

ගත් යම් යම් ක්‍රියාවන් හේතුවෙන් චෝදනා එල්ල වී ඇති නඩුවේ

මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව මෙම නිලධාරියා විසින් සිදු

කළ අඩංගුවට ගත් පසු පහරදීමක් හෝ අමානුෂික ලෙස සැලකූ බවට

ප්‍රශ්න කර නොමැත.

18 NOV 2010

(34)

(479)

ඉහත සඳහන් කහකාර පොලිස් අධිකාරීවරයා විසින් මෙම නඩුවේ විත්තිකරු, අපරාධෝචිත්‍යාරණයක් සටහන් කර ගැනීම සඳහා කහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක වෙත ඉදිරිපත් කරන ලද්දේ, විත්තිකරුගේ ලේලිම මත බවට කරන ලද ප්‍රකාශය අසත්‍ය ප්‍රකාශයක් බවට විත්තියෙන් යෝජනා කරන ලද නමුත්, මහු එය ප්‍රතික්ෂේප කර සිටියේය. තවද, මෙම විත්තිකරුට මෙන්ඩිස් කැමැති පොලිස් නිලධාරියා පසර දුන්න බවට ද විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කල නමුත්, එය ඔහු විසින් ප්‍රතික්ෂේප කළේය. ඒ සැර, එවකට කෝමාගම පොලිස් ස්ථානාධිපතිව සිටි මෙම නිලධාරියා, මෙම විත්තිකරුව අත් අඩංගුවට ගැනීමට මූලිකව කටයුතු කල නිලධාරියා වුවත්, ඔහු විත්තිකරුට පසර දුන්න බවට කෝ බලපෑමක් කල බවට අභියෝග කර නොමැත. ආතර් බණ්ඩා දත් ගැලවීම පිළිබඳව ප්‍රසිද්ධියේ දරන තැනැත්තෙකු හැටියට ඔහුගෙන් බලපෑමක් සිදුවීමට බොහෝසෙයින් ඉඩකඩ තිබූ බවට සහ මෙන්ඩිස් නැමැත්තා පසර දුන්න බවට කල යෝජනාව සැර මෙම සහකාර පොලිස් අධිකාරී වරයා විත්තිකරුට යම් බලපෑමක් කෝ තර්ජනයක් කල බවට යෝජනාවක්වත් කර නොමැත.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමේදී අපරාධෝචිත්‍යාරණය සටහන් කර ගත් අනුර සේනානායක සහකාර පොලිස් අධිකාරීවරයා ට කෝ මේ විත්තිකරු අත් අඩංගුවට ගෙන පොලිසියේ රඳවාගෙන සිට, අපරාධෝචිත්‍යාරණය සටහන් කර ගැනීම සඳහා ඉදිරිපත් කළ, මෙම සාක්ෂිකරුට එරෙහිව, විත්තිකරුට තර්ජනයක් කෝ බලපෑමක් කල බවට අභියෝගයක් කර නොමැති බැවින්, විත්තිකරු සිය

සිය කැමැත්තෙන්ම මෙම අපරාධෝච්චාරණය කළ බව සනාථ වේ. මෙම පොලිස් නිලධාරීන් දෙදෙනා උසස් නිලධාරීන් බැවින්, රට පහළ සිටින නිලධාරීන්ගෙන් යම් බලපෑමක් වූයේ නම්, මෙම නිලධාරීන්ට ඒ පිළිබඳව පැමිණිලිකිරීමට විත්තිකරුට හැකියාවක් තිබුනි. එමෙන්ම, අන්අඩංගුවට ගෙන මාසයක් තුලදී, මහේස්ත්‍රාන්වරයා වෙත විත්තිකරුව ඉදිරිපත් කර ඇත.

විත්තිකරුට යම් යම් තර්ජන හා බලපෑම් තිබුනා නම් හෝ විත්තිකරු ප්‍රකාශ කර ඇති පරිදි, මෙන්ඩිස් නැමැති පොලිස් නිලධාරියා, විත්තිකරුට පහරදී විත්තිකරුගේ ශරීරයේ ඉදිමිම්, සිරිම් යනාදී තුවාල තිබුනා නම්, ඒ පිළිබඳව පැමිණිලිකිරීමට ද විත්තිකරුට හැකියාවක් තිබුනි. නමුත් විත්තිකරු ඒ පිළිබඳව මහේස්ත්‍රාන්වරයා ට හෝ උසස් නිලධාරීන්ට පැමිණිලිකර නොමැත.

මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලදැයි කියන අපරාධෝච්චාරණයේ සැකයන් කරුනු සම්බන්ධව පැමිණිල්ලේන් කැඳවන ලද සහකාර පොලිස් අධිකාරීවරුන් දෙදෙනෙක් ගෙන් ප්‍රශ්ණ කර ඇත්තේ, ප්‍රේමතිරත්න ද අල්විස් ~~කැඳවූ~~ ප්‍රසිද්ධ නලා කාරයෙකු හා රජයේ උසස් අය අදුනන කෙනෙක්නිසා ඔහුගේ මරණය සම්බන්ධයෙන් වූ ලිපි ගොනුව අවසන් කිරීම සඳහා කිසියම් නවිරුහෝ වේවා එයට සම්බන්ධ කිරීමට උත්සාහයක් ගත්තා බව පෙන්වීමට ය. එසේ නොමැතිව එම අපරාධෝච්චාරණය ප්‍රේමතිරත්න ද අල්විස් ගේ මරණයට අදාලව ඇති නොවැදගත් කාරණයක් බව හෝ බලපෑමක් මත මෙම නිලධාරීන් දෙදෙනා විසින් ලබා ගත්ත ඒවා බවට අභියෝගයක් කර නොමැත. වෙනත් නිලධාරීන් විත්තිකරුට පහර දුන්න බවට යෝජනා කර ඇතත්, ඉහතින් සඳහන් සහකාර පොලිස් අධිකාරී

18 NOV 2014

විරුද්ධ දෙදෙනාට එරෙහිව එවැනි අභියෝගයක් එල්ලතර නොමැත. කවද, එම විත්තිකරුගේ අපරාධෝච්චාරණයෙහි ඇති එම තරුණු සැළකිල්ලට හැනිවේදී එවැනි විස්තරාත්මක තරුණු පොලිස් නිලධාරියෙකුට වුවද හොඳ ඉදිරිපත් කළහැනි ආකාරයේ ඒවා යයි විශ්වාස කළ නොහැකිය. යම් කැනැත්තෙකුට බලපෑමක් කර, චෝදනාවකට වරද පිළි ගැනීමක් එසේ නැතහොත් එම චෝදනාවට සම්බන්ධවන ආකාරයේ ප්‍රකාශයක් සටහන් තල්ලකකැති වුවත්, මෙම නඩුවේ අපරාධෝච්ඡාරණයේ සඳහන් ආකාරයට විස්තරාත්මකවූ තරුණු විත්තිකරුගෙන් කැර වෙකත් කැනැත්තෙකුට අසත්‍ය ලෙස සම්මොදනය කළ හැකියයි විශ්වාස කළ නොහැකිය.

රජයට මුලින්ම සාක්ෂි දුන්න අපරාධෝච්ඡාරණය සටහන් කරගත්, සහකාර පොලිස් අධිකාරී අනුර සේනාරියෙක මහතා නැවත නැඳුවා තමා මුලින් පැ.1 වශයෙන් ලකුණුකර ඉදිරිපත් කල අපරාධෝච්ඡාරණයේ දෙවන පිටපත ඉදිරිපත් කරන්ටිදේය. මුල් පිටපතේම නාබන් පිටපතත් වන එම දෙවන පිටපතේ අවශ්‍ය ස්ථානවල විත්තිකරු අත්සන් කර ඇති බවත් එම අත්සන් ඔහු මුල් පිටපතේ ද එලෙස අත්සන් කබා ඇති බවත් නියාසිටියේය. එම නාබන් පිටපතේ විත්තිකරුගේ අත්සන යොදා ඇත්තේ තීන්තෙන් බවක් එය නාබන් වැදුන අත්සනත් නොවන බවත් ඔහු නියාසිටියේය. තවද එම පිටපතේ අපරාධෝච්ඡාරණය ලබා ගත්ත බවට සම්බන්ධ අත්සන් කර ඇති බව ද නියා සිටියේය. සාමාන්‍යයෙන්, විශේෂයෙන්ම අපරාධෝච්චාරණයක් යතුරු ලියනය කරන විට, පිටපත් දෙකක් සහිතව යතුරු ලියනය කරන බවත්, එසින් මුල් පිටපත හොඳුවට ඇතුලත්කරන බවත් නියාසිටියේය.

මෙම අපරාධෝච්ඡාරණයට අදාල මුල් පිටපත ගොනුවේ නොමැති බවත් එය ගොනුවෙන් ඉවතට සෑම උත්සාහයන්ම හත් අතර, යම් අතපසුවීමකින් එය මුල් ගොනුවට ගොනුවී නොමැති නිසා, එයට අදාල නීලධාරීන්ට විරුද්ධව දැනට මත් විශේෂ පරීක්ෂණයක් පවත්වාගෙන යන බව මෙම සභතාර පොලිස් අධිකාරී වරයා නියෝජිටියේය. මෙම නඩුවට ලකුණුත්‍ර ඉදිරිපත් කරන ලද පැ.1 දරණ මුල් පිටපත හා එහි කාබන් පිටපතේ තමන්ගේ හා විත්තිකරුගේ අත්සන් නියමිත ස්ථාන වල හා වෙනස් කළ කරන ලද ස්ථානවල තිබෙන් යොදා අත්සන් තබා ඇති බව ඔහු කියාසිටියේය.

මෙම නඩුවට අදාල අපරාධෝච්ඡාරණයේ මුල් පිටපත ඉදිරිපත් නොකිරීම පිළිබඳව විත්තියෙන් ප්‍රශ්ණ කළ නැති හෙයින් කාබන් පිටපත ඉදිරිපත් කිරීමට අවසර දෙන ලදී.

දෙවන අවස්ථාවේදිද කාබන් පිටපත ඉදිරිපත් කිරීමට සභතාර පොලිස් අධිකාරී අනුර සේනානායක මහතා සාක්ෂිදුන් අවස්ථාවේදී, විත්තියෙන් ඔහුගෙන් යළි ප්‍රශ්ණ අසන ලදී. ඒ අනුව මුල් පිටපත පොලිස් ආඥාපනතිය ට දුන්න බවත්, අවුරුදු 3 කට පමණ පසුව මුල් පිටපත නොමැති වීම පිළිබඳව නුගේගොඩ දේශයධ පොලිස් අධිකාරි විසින් පරීක්ෂණයක් පවත්වන බවත් කියා සිටියේය. ඒ හැර වෙනත් යළස් ප්‍රශ්ණ අසා නැත.

ඉහත සඳහන් සාක්ෂියත් සමග, පැ.1 සිට පැ.6 දක්වා ලේඛණ ඉදිරිපත් කරමින් පැමිණිල්ල සාක්ෂි මෙහෙයවා අවසන් කරන ලදී.

මෙම නඩුවේ, ඉහතින් දැක්වූ කරුණු සැලකිල්ලට ගැනීමේදී පැමිණිල්ල ඉදිරිපත් කරන ලද සාක්ෂි වලින් හෙළිදරව් වූ කරුණු අනුව විත්තිකරු විසින්

එම ප්‍රේමතිලක ද අල්විස් ගේ මරණය සිද්ධ කළ

දින්දා නිවස තුළ සිටි තැනැත්තන්, ඔවුන් නවා තල දේ පවා විත්තිකරු

සතු සිටි බවත්, මරණයෙන් පසුව, කිසි තලබලයක් නොදැනිව අපපසු

මේ මරණය සිදු නිරීමට යොදවා ගත්ත කුවත්තු හා පතරොම් විත්තිකරු

අපසු බාරගෙන සඟවා තබා ඇත. ප්‍රේමතිලක ද අල්විස් ගේ මරණය

පිළිබඳ සැකය වෙඩි පහරවල් එල්ල තරන ලද්දේ, මිලින්ද වික්‍රම සූ

සේ නවත් පුද්ගලයෙකු වුවත්, ඉහත සඳහන් පරිදි, එම ක්‍රියාව නිරීමේදී

විත්තිකරු-ද අල්විස් ගේ නිවස පවා පෙන්වා දී මේ විත්තිකරු එම අපරාධයට

සම්බන්ධ වී ඇත. මේ අනුව මෙම විත්තිකරු, 'යොදු මරණීය චේතනාවත් ඇතිව,

ප්‍රේමතිලක ද අල්විස් ගේ මරණය සිදු නිරීමට සහභාගී වී ඇති බව' පැමිණිල්ල

සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර ඇත. පැ.7ඒ සිට නිවී දක්වා වූ

චෝදිච්චාරණයේ සඳහන් පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද තොරස් සැලකිල්ලට

ගනිමි, එවැනි තරුණ මෙම අපරාධයට සහභාගී වූ තැනැත්තෙකු හෙන් කැර

තැනැත්තෙකුගෙන් ලබා ගතහැකි තරුණ නොවන බව අපගියයි.

මෙම නඩුවේ ඉහත සඳහන් තරුණ සැලකිල්ලට ගැනීමේදී, විත්තිකරුට

එරිව ඇති චෝදනාව සාධාරණ සැකයෙන් තොරව ඔප්පු විය හැකි අන්දරයේ

පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇත.

18 NOV 2010

ද්‍රෝමනිර්ති ද අල්විස් ගේ මරණය සිදු නිරීමට සහායු වී ඇති බව පෙනී

එම ද්‍රෝමනිර්ති ද අල්විස් ට, ඕලිහ්ද හා ධීත්‍රම යන අය වෙඩි තබන

ලද අතර, රට අමතවර, ලක්ෂමන් සහ එම නිවාසයේ සිටි සෙසු පිරිස්

සමග ද්‍රෝමනිර්ති ද අල්විස් ගේ නිවස සොයා ගැනීම සඳහා මග පෙන්වා

මෙම චිත්තිතරු ය. එමෙන්ම එම මරණය සිදු කරන තුරු, අවට නිවෙස්

විදුලි පහන් නිවීමට කටයුතු කර ඇත්තේ මෙම චිත්තිතරු ය. එපමණක් ද

නොව, මෙම චිත්තිතරුගේ සහෝදරයෙකු වුද කමුදාවෙන් ඉවත් වී මෙහි

සංඝයාගේ වී සිටි බව ද බූස්සේ රඳවා ඇති බව ද එමෙන්ම, පියසිරි නැවැත්වූ

බූස්සේ රඳවා ඇති බවත්, එම තැනැත්තන් ද මෙහෙට සහයෝගී වූ බවත්

පැහැදිලි ව ඔප්පු වී ඇත. තම නායකයාගේ නියමය පරිදි, මෙම ඝාතනය

නිරීමට ආයුට නිබූ ස්ථානයෙන් ගෙනත් දීම, එමෙන්ම එම මරණය සිදු කිරීම

සුදානම් වීමත් වශයෙන්, රෙදි කඩවලින් මුහුණ වසා ගැනීම යන ක්‍රියා

මෙම චිත්ත්‍රිතරු සිය නැමැත්තෙන්ම සහයෝගී වී ඇත.

ඒ අනුව, මෙම මරණය සිදු නිරීමට චිත්තිතරු සහයෝගී

එයට සුදානම් වී එම මරණය සිදු නිරීමට සහය හා අනුබලය දී ඇති

පැහැදිලිවම ඔප්පු වී ඇත.

18 NOV 2010

මෙම නඩුවේ විත්තිය කැඳවූ අවස්ථාවේදී, ඉලින්ම මෙම නඩුවේ විත්තිකරු වන තමාගේ සහන් ප්‍රියන්ත සාක්ෂි දී සිටියේය. තමා හෝමාගම නගරයේ සිට සැතැපුම් 11/2ක් පමණ දුරින් පිහිටි නෝ: 251 දරණ නිවසේ පදිංචිකරුවෙකු බව කියා සිටියේය. එම නිවසේ තමාත්, තම මව සහ අක්කා වන සුමනාවතී තමාගේ පදිංචිව සිටින බවත්, පියා මිය ගොස් ඇති බවත්, කියා සිටියේය. තම පවුලේ තමා සමඟ සහෝදර සහෝදරියන් 10 දෙනෙකු සිටින බවත්, එයින් හතර දෙනෙක් නිවස අසලම පදිංචිව කුලී වැඩ කරමින් ජීවත් වන බවත්, තමා හැර සෙසු සියළුම සහෝදර සහෝදරියන් දැනට විවාහ වී සිටින බවත් කියා සිටියේය. තම සහෝදරියන් සමඟ විවාහ වී සිටින තැනැත්තන් දෙදෙනෙකු රැකියා නැතිව සිටින බවත්, එක් අයෙක් වන්වී විස්කෝතු සවාරියේත්, තවත් තැනැත්තෙක් මහා මාර්ග අංශයේත්, සේවය කරන බවත්, තමාගේ සහෝදරියන්ද, වන්වී අංශයේ සාමාන්‍ය සේවිකාවන් ලෙස සේවය කරන බව පිළිගත්තේය. හෝමාගම ඉපිද නියදගල හාසලට ගොස් ඉන් පසුව විද්‍යාලංකාර පිරිවෙනට ගොස් 10 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ බවත්ය. ඔහු පිළිගත්තේය. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට වැඩ 3 ක් සමත් වී බවත්, විභාගය හැරේ එක් විභාගයක් බවත් කියා සිටියේය. රැකියාවක් පිරිමට තමා තුළ තිබුන අවශ්‍යතාවයේ හේතුවෙන් ඉන් පසුව විභාගය නොහැර බවත්, මව සහ අක්කා දුක් විඳින නිසා රැකියා වක් පිරිවේ අදහසින් වන්වී අංශයේ සාමාන්‍ය සේවිකාවක් වශයෙන් බැඳී මාස 4-5 සේවය හැර බව ඔහු පිළිගත්තේය. එම සේවය ස්ථිර නොකළ නිසා මාස හතරකට පසුව ඔහුගේ වැඩ නතර කළ බවත්,

ගේ පසුව කුලී වැඩ, කුඹුරු වැඩ, මේසන් බාස් ඉඩිකාවල යෙදී සිටි බවත්, තමාට කුඹුරු තිබෙන බවත්, විත්තිකරු පිළිගත්තේය. සාමාන්‍යයෙන් එවැනි කුලී වැඩ වල නිරතව සවස 5.00 වන විට තමා ආපසු නිවසට පැමිණෙන බවත් මියු තියා සිටියේය.

එම් අබස්ථාවේදී එනම් 1989 යේ 10 මස තමාගේ මව සහ අක්කා එකතුවී තමා මවුදාවට හාර දුන් බවත්, එසේ හාර දීමට හේතුව වූයේ, මවුදවෙන් තමාගේ නිවසට පැමිණ තමා සොයා නිබූ නිසා බවත්, විත්තිකරු පිළිගත්තේය. මවුදාව විසින් තමා සොයන ලද්දේ කුමන කාරණාවක් නිසාදැයි නොදන්නා බවුත්, පනාගොඩ යුඩි මවුදා තඳවුරට ගොස් යුඩ මවුදා පොලිසියට හාර වුන බවත්, ඔවුන් තමා හාර ගෙන හාර ගත් දින රෑවෙනතුවී එම තඳවුරේ තමා ගෙන සිට අතුරුඹිරියේ තඳවුරට එදාම රෑ රැගෙන ගිය බව මියු තියා සිටියේය. අතුරුඹිරිය තඳවුරේ මාස 11/2ක් ඉඳලා සිට එහිදී අඩන්සේට්ටම් තළ බවත්, තවත්ට පහර දුන් බවත්, විත්තිකරු තියා සිටියේය. එම තඳවුරේ සිටි තෙනෙක් තමා හඳුනන තැනැත්තෙක් වූ අතර, එම තැනැත්තා පහර දුන් බවත්, තියා සිටි විත්තිකරු, තමාගෙන් ප්‍රශ්න නොකළ බවත් තැත්තක් තියා සිටියේය. තමාට පහර දෙමින් තමාගෙන් අසා සිටියේ, ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධයෙන් බවත් මියු තියා සිටියේය. එම පෙරමුණේ තමා සාමාජිකයෙක්ද යන්න තමාගෙන්

